JMC vLearning
"your virtual learning partner"

# බදු පරිපාලනය සහ ව්‍යවස්ථාපිත රෙගුලාසි

තුෂාර ඉන්දික ජයවීර

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

## ස්ව තක්සේරු ක්‍රමය

බදු ගෙවන්නා විසින් ආදායම් ගණනය කර බද්ද ගණනය කර බද්ද ගෙවා වාර්තා ඉදිරිපත් කිරීමේ ක්‍රමය.

### ස්ව තක්සේරු ගෙවීම් (Self-assessment Payments)

ආදායම් බදු ගෙවිය යුතු තැනැත්තෙකු විසින් ආදායම් බද්ද කාර්තු වශයෙන් ගෙවිය යුතුයි.

කාර්තු ගෙවීම් කළ යුතු දිනයන්,

i. කාර්තුව අගෝස්තු 15 හෝ ඊට පෙර

ii. කාර්තුව නොවැම්බර් 15 හෝ ඊට පෙර

iii. ඊට පසු වර්ෂයේ පෙබරවාරි 15 හෝ ඊට පෙර

iv. ඊට පසු වර්ෂයේ මැයි 15 හෝ ඊට පෙර

v. අවසාන ගෙවීම් සැප්තැම්බර් 30 හෝ ඊට පෙර

ස්ව තක්සේරු ගෙවීම් යටතේ 10% වට්ටමක් ලබා ගැනීමට නම් නියමිත දිනට දින 30 පෙර ගෙවිය යුතුය.

#### අභ්‍යාස

2017/18 වසර සඳහා ස්වතක්සේරු ගෙවීම් සහ අවසාන බදු ගෙවිය යුතු දිනයන් දක්වන්න.

### අනුකූලතාවය (compliance)

පනතේ සඳහන් ආකාරයටම බදු ගෙවන්නෙකු විසින් කටයුතු කිරීමයි. අනුකූලතාවය කොටස් දෙකකි.

1. වාර්තා අනුකූලතාවය
2. ගෙවීම් අනුකූලතාවය

වාර්තා අනුකූලතාවය (return compliance)
නියමිත ආකෘති පත්‍රයක නියමිත පරිදි සම්පූර්ණ කර නියමිත දින වාර්තාව ඉදිරිපත් කිරීමයි.

ගෙවීම් අනුකූලතාවය (payment compliance)
නියමිත බද්ද නියමිත දිනට නියමිත ආකාරයට ගෙවීමයි.

### වාර්තා ඉදිරිපත් කිරීම

වාර්තාවක් යනු දේශීය දෙපාර්තමේන්තුවේ ආදායම් බදු ලිපිගොනුවක් පවත්වා ගෙන යන තැනැත්තෙකු විසින් වාර්ෂිකව තමාගේ ආදායම, වත්කම් හා වගකීම් විස්තර ඉදිරිපත් කිරීමයි. වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වන්නේ තක්සේරු වර්ෂය අවසන් වී පළමුව එළඹෙන නොවැම්බර් 30 හෝ ඊට පෙරය.

#### අභ්‍යාස

2017/18 වසර සඳහා ආදායම් වාර්තාව ඉදිරිපත් කළ යුතු දිනය දක්වන්න.

### නියමිත දිනට වාර්තා ඉදිරිපත් කිරීමේ වාසි

නියමිත දිනට වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් බදු ගෙවන්නකුට ඇතිවන වාසිය නම් එම වාර්තාවල වසර දෙකක කාල කඩඉමකට යටත් වීමයි. එනම් එම වාර්තාව සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කටයුතු කළ හැකි කාලසීමාව වසර 2 ක් වීම. නියමිත දිනට පසුව ඉදිරිපත් කිරීමේ කාලසීමාව වසර 04 ක් දක්වා දීර්ඝ වේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

වාර්තාව ඉදිරිපත් නොකිරීම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ගත හැකි ක්‍රියා මාර්ග

1. රු. 50,000 උපරිමයකට යටත් කොට දඩයක් පැනවීම.
2. අධිකරණයේ නඩුවක් පැවරීම.
3. ඇස්තමේන්තු තක්සේරුවක් නිකුත් කිරීම.
4. දඩයක් පැනවීම හා ඇස්තමේන්තු තක්සේරුවක් නිකුත් කිරීම.
5. නඩුවක් පැවරීම හා ඇස්තමේන්තු තක්සේරුවක් නිකුත් කිරීම.

වාර්තාවක් ඉදිරිපත් නොකරීම මත එහෙත් එකම තක්සේරු වර්ෂයක් වෙනුවෙන් දඩයක් පැනවීම හා නඩුවක් පැවරීම යන දෙකම ක්‍රියාත්මක කළ නොහැකිය.

## තක්සේරු නිකුත් කිරීම (Assessment)

තක්සේරුවක් යනු බදු ගෙවන්නෙකුට බද්ද පැනවීමයි. තක්සේරු නිකුත් කරන අවස්ථා දෙකකි.

1. ඇස්තමේන්තු තක්සේරුව
2. වාර්තාව ප්‍රතික්ෂේප කර තක්සේරු නිකුත් කිරීමයි.

ඇස්තමේන්තු තක්සේරුවක් යනු ආදායම් වාර්තා ඉදිරිපත් කර නොමැති අවස්ථා වලදී ආදායම් ඇස්තමේන්තු කර තක්සේරු නිකුත් කිරීමයි. ඉදිරිපත් කරන ලද වාර්තාවේ වැරදි හා අඩු පාඩු නිසා වාර්තාව ප්‍රතික්ෂේප කර තක්සේරු නිකුත් කිරීමයි.

නිකුත් කරන ලද තක්සේරුවක් වලංගු වීමට නම් තක්සේරුව නිකුත් කිරීමට පෙර තක්සේරුව නිකුත් කිරීමට හේතු බදු ගෙවන්නාට දැනුම් දිය යුතුයි.

තක්සේරු දැන්වීමක් යනු බද්දක් පැනවූ බව දන්වා යවන නිවේදනයයි.

## අභියාචනා (Appeals)

වලංගු තක්සේරු දැන්වීමක් ලැබුණු විට එයට විරුද්ධ කරුණු ඉදිරිපත් කිරීමේ අයිතිය බදු ගෙවන්නකුට ඇත. මෙසේ කරුණු ඉදිරිපත් කිරීම අභියාචනයයි. අභියාචනය වලංගු වීමට නම් තක්සේරු දැන්වීමේ දින සිට දින 30 ක් ඇතුලත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නමට ලිඛිතව හේතු ඉදිරිපත් කළ යුතුයි.

ඇස්තමේන්තු තක්සේරුවකට විරුද්ධව කරන අභියාචනයක් නම් ඉහත කරුණු වලට අමතරව ඉදිරිපත් නොකරන ලද වාර්තාවේ පිටපතක් හා වාර්තාව පරිදි බදු ගෙවා තිබිය යුතුයි.

## ප්‍රමාද අභියාචනා (Late Appeals)

නියමිත දිනට පසුව ඉදිරිපත් කරන අභියාචනා ප්‍රමාද අභියාචනා වේ. මෙසේ ප්‍රමාද අභියාචනාවක් භාර ගැනීමේ අයිතිය කොමසාරිස් ජනරාල්වරයා සතුවේ. එය පහත අවස්ථා වලදී සිදුවේ.

1. අභියාචනය ඉදිරිපත් කළ යුතු කාලසීමාව තුළ ලංකාවේ නොසිටීම.
2. එම කාලයෙහි අසාධ්‍ය රෝගී තත්ත්වයකින් පසුවීමයි.
3. වෙනස් සාධාරණ හේතු

   උදා: ස්වභාවික විපත්

අභියාචනයේ දැක්වෙන කරුණු වලට අමතරව ප්‍රමාද වීමට හේතුද ලිඛිතව ඉදිරිපත් කළ යුතුයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## අභියාචනා විසඳීම

### විසඳීමේ අවස්ථා

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................

බදු අය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග (Recovery Procedure)

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................
5. ..........................................................................................................................

හිඟ ආදායම් බදු සඳහා දණ්ඩන පැනවීම (Penalty Provision)

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................

ආපසු ගෙවීම් (Refund Procedure)

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd